## කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## පුරප්පාඩු

කැලණිය විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. පොත් බැඳුම්කරු (III ශ්‍රේණිය) - ස්ථිර සේවයට

**සුදුසුකම් :**

1. තනතුරට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (N.V.Q.) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (N.V.Q. Level) තහවුරු කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.

**වයස් සීමාව :** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුයි.

සටහන :- (a) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(b) තනතුරේ රාජකාරී මැනවින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(c) විශිෂ්ට සදාචාර සම්පන්න චරිතයකින් යුක්ත විය යුතුය.

**වැටුප් ක්‍රමය :** U-PL 3 (III ) - රු. 48,005 - 16 x 490 - 55,845 (මාසික)

අනෙකුත් දීමනා ඇතුළුව මාසික දළ වැටුප ආසන්න වශයෙන් **රු. 80,798 /-** කි.

(ඉහත වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025 අනුව වැටුප් පරිමාණය වේ. මූලික වැටුපට අමතරව රජය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගනු ලබන ආකාරය :** වෘත්තීය පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 02. වැද්දුම්කරු (III ශ්‍රේණිය) - ස්ථිර සේවයට

**සුදුසුකම් :**

1. තනතුරට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (N.V.Q.) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (N.V.Q. Level) තහවුරු කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.

**වයස් සීමාව :** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුයි.

සටහන :- (a) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(b) තනතුරේ රාජකාරී මැනවින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(c) විශිෂ්ට සදාචාර සම්පන්න චරිතයකින් යුක්ත විය යුතුය.

**වැටුප් ක්‍රමය :** U-PL 3 (III ) - රු. 48,005 - 16 x 490 - 55,845 (මාසික)

අනෙකුත් දීමනා ඇතුළුව මාසික දළ වැටුප ආසන්න වශයෙන් රු**. 80,798 /-** කි.

(ඉහත වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025 අනුව වැටුප් පරිමාණය වේ. මූලික වැටුපට අමතරව රජය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගනු ලබන ආකාරය :** වෘත්තීය පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

## 03. ට්‍රැක්ටර් ක්‍රියාකරු (III ශ්‍රේණිය) - ස්ථිර සේවයට

**සුදුසුකම් :**

1. අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සමාර්ථ (C) දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම සහ තනතුරට අදාළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් N.V.Q. 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම ( N.V.Q. Level) තහවුරු කිරීම සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ( Tertiary and Vocational Education Commission ) මඟින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.

**හෝ**

2. අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සමාර්ථ (C) දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ කාර්මික කුසලතා සමඟ වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**වයස් සීමාව :** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුයි.

සටහන :- (a) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(b) තනතුරේ රාජකාරී මැනවින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(c) විශිෂ්ට සදාචාර සම්පන්න චරිතයකින් යුක්ත විය යුතුය.

**වැටුප් ක්‍රමය :** U-PL 2 (III ) - රු. 44,575 - 16 x 490 - 52,415 (මාසික)

අනෙකුත් දීමනා ඇතුළුව මාසික දළ වැටුප ආසන්න වශයෙන් රු**. 76,674 /-** කි.

(ඉහත වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025 අනුව වැටුප් පරිමාණය වේ. මූලික වැටුපට අමතරව රජය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගනු ලබන ආකාරය :** වෘත්තීය පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

## 04. ආරක්ෂක පරීක්ෂක (කොන්ත්‍රාත් පදනම මත)

**සුදුසුකම් :**

1. අ. දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 05 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 කින් අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වී තිබිය යුතුය. එසේ සම්මාන සාමාර්ථ ලබාගත් විෂයයන් අතරට සිංහල/දෙමළ භාෂාව හෝ සාහිත්‍යය සහ අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය යන විෂයන් ඇතුළත් විය යුතුය.

**හෝ**

ආ. තුන්වරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06 කින් අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව ඇත්තා වූ සහ වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවකයින් විය යුතුය. සමත්ව ඇති විෂයයන්ට සිංහල/දෙමළ භාෂාව හෝ සාහිත්‍යය සහ අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය යන විෂයන් ඇතුළත් විය යුතුය.

**සහ**

2. පොලිස් හෝ හමුදා සේවයේ හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක ආරක්ෂක සේවයේ හෝ පිළිගත් ආරක්ෂක සේවා ආයතනයක ආරක්ෂක සේවයේ වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

3. ක්‍රීඩාවන්හි ක්‍රියාශීලී ලෙස සහභාගි වී තිබිය යුතුය.

4. උස : අඩි 5 අඟල් 4 කට නොඅඩු විය යුතුය.
   පපුව : අඟල් 34 කට නොඅඩු විය යුතුය. (සාමාන්‍ය)

5. වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

- **වැටුප - රු. 64,213 /- (මූලික වැටුප සහ ජීවන වියදම් දීමනාව ඇතුළුව) ගෙවනු ලබන අතර, ඊට අමතරව විශ්වවිද්‍යාලයේ අදාළ නියමයන් හා චක්‍රලේඛ විධිවිධාන අනුව අතිකාල දීමනා ද ගෙවනු ලැබේ.**
- **ප්‍රතිලාභ - විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට හිමිකම් ලබයි.**
- **කොන්ත්‍රාත් කාලය අවසානයේ සේවය ඇගයීමෙන් පසුව සතුටුදායක සේවයක් සපයන අයගේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම පිළිබඳ සලකා බලනු ලැබේ. මෙහි අවසන් තීරණය පාලක සභාවේ තීරණය වේ.**
- **කොන්ත්‍රාත් කාලය - මාස 06 කි**
- **තෝරා ගැනීම - සම්මුඛ පරීක්ෂණයක් මඟින්**

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

## 05. ආරක්ෂක නියාමක (කොන්ත්‍රාත් පදනම මත)

**සුදුසුකම් :**

1. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවතාවකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් සම්මාන සමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

**වයස :** අයදුම්පත් භාර ගන්නා දිනට අවුරුදු 18 ට වැඩි විය යුතු අතර 45 ට නොවැඩි විය යුතු ය.

**වෙනත් අවශ්‍යතා :**

සියලු අයදුම්කරුවන් ;

1. ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.
2. තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතු ය.
3. මනා චරිතයකින් හෙබි පුද්ගලයන් විය යුතු ය.

- වැටුප - **රු. 58,563 /- (මූලික වැටුප සහ ජීවන වියදම් දීමනාව ඇතුළුව) ගෙවනු ලබන අතර, ඊට අමතරව විශ්වවිද්‍යාලයේ අදාළ නියමයන් හා චක්‍රලේඛ විධිවිධාන අනුව අතිකාල දීමනා ද ගෙවනු ලැබේ.**
- ප්‍රතිලාභ - **විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට හිමිකම් ලබයි.**
- **කොන්ත්‍රාත් කාලය - මාස 06 කි**
- **තෝරා ගැනීම - සම්මුඛ පරීක්ෂණයක් මගින්**

## <u>අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය</u>

වැඩි විස්තර සහිත දැන්වීම සහ අයදුම්පත් විශ්වවිද්‍යාලයේ නිල වෙබ් අඩවියට (services.kln.ac.lk) පිවිසීමෙන් ලබාගත හැක. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාල සහතිකවල පිටපත් සමඟ ඉල්ලුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කර **2026 ඔක්තෝබර් මස 12** දින හෝ ඊට පෙර ලැබෙන පරිදි **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි / ආයතන අනධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, දළුගම, කැලණිය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම් කිරීමට පෙර ඉහත සඳහන් විශ්වවිද්‍යාලයේ නිල වෙබ් අඩවියේ පළකර ඇති සම්පූර්ණ විස්තරය සහිත දැන්වීම හොඳින් කියවා බලා අයදුම් කළ යුතු බව සියලු අයදුම්කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

ස්ථිර තනතුරු සඳහා අයදුම් කරන අය දැනට ස්ථිර සේවයේ යෙදී සිටි නම් තම අයදුම්පත් උසස් අධ්‍යාපන ආයතන, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කල යුතුය.

කොන්ත්‍රාත් තනතුරු හෝ පැවරුම් පදනමට අයදුම් කරන අය තම අයදුම්පත ආයතන ප්‍රධානින් විසින් එවීම අවශ්‍ය නොවේ.

අයදුම්පත් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුය. එසේම තනතුරු සියල්ලම හෝ ඉන් එකක් හෝ එකකට වැඩි ප්‍රමාණයන් බඳවා ගැනීමේ හෝ නොගැනීමේ තීරණය විශ්වවිද්‍යාලයේ පාලක සභාව සතු වේ. මේ සම්බන්ධ අවසාන තීරණය පාලක සභාවේ තීරණය වේ.

අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති,සුදුසුකම් වලට අදාල සහතික පිටපත් අමුණා නොමැති, අසම්පූර්ණ, අපැහැදිලි හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර එසේ ප්‍රතික්ෂේප කරනු ලැබූ අයදුම්පත් කිසිදු හේතුවක් නිසා හෝ යළි සලකා බලනු නොලැබේ.

**වැඩබලන ලේඛකාධිකාරි**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**2026.09.27**

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED